ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

60 | S | I,II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2010 ජුලි - 10 ශ්‍රේණිය
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2010 - Grade 10

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I , II**
**வணிகக் கல்வியும் கணக்கீடும் I , II**
**Business and Accounting Studies I , II**

පැය තුනයි
*Three hours*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

සැලකිය යුතුය :

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) **1** සිට **40** තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරට අදාල අංකය හා සැසඳෙන කවය මත (x) ලකුණ යොදන්න.**
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.
(v) I හා II පිළිතුරු පත්‍ර එක් පත්‍රයක් වන සේ එකට අමුණා භාර දෙන්න.

---

01. අවශ්‍යතාවයක් වනුයේ,
1. කමිසය ය.
2. ආහාර
3. පාවාහන්
4. බත්

02. පැරණි සමාජයේ පැවති වෙළෙඳාම් ක්‍රමය වන්නේ,
1. භාණ්ඩ හුවමාරුව
2. සිල්ලර වෙළෙඳාම
3. දේශීය වෙලෙදාම
4. ඍජු විකිණීම.

03. හොඳ මුදලක ලක්ෂණයක් වන්නේ,
1. විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම
2. මුදලේ අගය නිතර නිතර ඉහල පහල නොයා යුතුය.
3. විලම්භිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම.
4. වටිනාකම රැස්කිරීමේ මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම.

04. ශ්‍රම විභජනය යන්න වඩාත් හොඳින් පැහැදිලි කෙරෙන ප්‍රකාශය කුමක් ද?
1. ශ්‍රමිකයන් මාරු කරමින් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම.
2. විවිධ දක්ෂකම් යුතු සේවකයන් කණ්ඩායමක් යොදවා එක් භාණ්ඩයක් නිපදවීම.
3. එකිනෙකට වෙනස් සේවකයින් යොදවා භාණ්ඩ නිපදවීම.
4. පුද්ගලයින් කිහිපදෙනෙකු විසින් භාණ්ඩයක විවිධ කොටස් නිපදවීම.

05. පෙරළුම් කර්මාන්තයට අයත් වන්නේ,
1. මෝටර් රථ තැනීම
2. නිවසක් තැනීම.
3. මැටි වලින් ගඩොල් සෑදීම.
4. මේසයක් සෑදීම.

06. තෘතීය නිෂ්පාදන පමණක් ඇතුලත් වන කාණ්ඩය වන්නේ,
1. පතල් කැණීම් / ධීවර / කෘෂි
2. මෝටර් රථ / ඇඟලුම් / නිවාස / ස්වර්ණාභරණ
3. ප්‍රවාහනය / බැංකු / රක්ෂණය / සන්නිවේදනය
4. ප්‍රවාහනය / බැංකු / ඉදිකිරීම් / රක්ෂණය

07. ජාත්‍යන්තර ගනුදෙනු සඳහා ශ්‍රී ලාංකිකයින් විසින් වැඩි වශයෙන් යොදා ගන්නා විදේශ මුදල් වර්ගය වන්නේ,
1. එකසත් ජනපද ඩොලර්
2. බ්‍රිතාන්‍ය පවුම්
3. යූරෝ
4. ඩිනාර්

08. භාණ්ඩ හා සේවා පාරිභෝගිකයා අතට පත්කිරීමේ ක්‍රියාවලිය හැඳින්වෙන්නේ,
1. බෙදාහැරීම වශයෙනි.
2. අළෙවිකරණය වශයෙනි.
3. හුවමාරුව වශයෙනි
4. සංස්කරණය වශයෙනි.

දෙවන පිටුව බලන්න

09. ශ්‍රී ලංකා ජාතික තත්ව සම්මානය පිරිනමන ආයතනය වන්නේ,
   1. පාරිභෝගික කටුතු අධිකාරිය
   2. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
   3. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය
   4. ජාතික ශිල්ප සභාව.

10. එක් වාණිජ බැංකුවක ඉතිරිකිරීමේ ගිණුම් හිමියෙකුට එම බැංකුවේ වෙනත් ශාඛාවකින් ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර (ATM) කාඩ්පත භාවිත කර මුදල් ලබා ගැනිමට හැකියාවක් සහිත ගනුදෙනු පරිගණක ගත කරන ලද බැංකු හදුන්වන්නේ,
   1. ඒකීය බැංකු ක්‍රමය (Uni Banking System)
   2. ඉලෙක්ට්‍රොනික මුදල (E-Money)
   3. අන්තර් බැංකු කරණය (Inter Banking )
   4. ප්ලාස්ටික් කාඩ් ක්‍රමය (Plastic Card System)

11. භූගෝලීය පරිසරයට අදාල නොවන්නේ,
   1. සුනාමි තත්වයන්
   2. පසේ සාරවත් බව
   3. ඛනිජ සම්පත්
   4. කෘෂිකාර්මික භාණ්ඩ වල මිල මට්ටම

12 ආර්ථික පරිසරයට අදාල වන්නේ,
   1. සුනාමි තත්වයන්
   2. ජීවන වියදම
   3. ජනගහනය
   4. පසේ සාරවත් බව

13. පාරිභෝගික ආරක්‍ෂාව පිළිබඳ කටයුතු කිරීමේ බලතල හිමි ආයතනය කුමක් ?
   1. ප්‍රමිති ආයතනය
   2. පාරිභෝගික ආරක්‍ෂණ අධිකාරිය
   3. මධ්‍යම පරිසර අධිකාරිය
   4. ඉහත සියල්ල ම.

14. සමුපකාර පණත අනුව වර්තමානයේ දී සමුපකාරයක් ලියාපදිංචි කිරීම සදහා අවශ්‍යවන ලියවිල්ලක් වන්නේ,
   1. සාංගමික ව්‍යවස්ථාවලිය.
   2. ආදායම් බදු වාර්තාව
   3. ලියාපදිංචිය සදහා ස්ථිර වු රැස්වීම වාර්තා පිටපත්
   4. මුල් සාමාජිකයින් විසින් අත්සන් කරන ලද නියමිත ආකෘතියේ වු ඉල්ලුම්පත් 2ක්

15. ව්‍යාපාර ආයතනයක් ලියාපදිංචි කිරීම මගින් ව්‍යාපාර ආයතනයකට ලබා ගත හැකි ප්‍රතිලාභ වන්නේ,
   1. පිළිගැනීමක් ඇති වීම
   2. නීතිමය රැකවරණයක් ලැබීම.
   3. ණය ලබා ගැනීම
   4. ඉහත සියල්ලම.

16. හවුල් ව්‍යාපාරයක පැවැත්ම බෙහෙවින් තහවුරුකර ගත හැක්කේ,
   1. හවුල්කරුවන් ප්‍රාග්ධනයට සමානව දායක වීමෙනි.
   2. සියලුම හවුල්කරුවන් කලමණාකරණයට සක්‍රිය ලෙස සහභාගි වීමෙනි.
   3. ලිඛිත ගිවිසුමක් ඇති ව පවත් වා ගෙන යාමෙනි.
   4. හවුල් ව්‍යාපාරයක ලියා පදිංචි වීමෙනි.

17. 2007 අංක 07 දරණ සමාගම් පනත නිසා අක්‍රිය වු ව්‍යාපාර සංවිධානය වන්නේ,
   1. ඇපයෙන් සීමිත සමාගම්
   2. පෞද්ගලික සමාගම්
   3. ජනතා සමාගම්
   4. පොදු සමාගම්

18. සීමා සහිත සමාගමක ප්‍රාග්ධනය සපයනු ලබන්නේ,
   1. හවුල්කරුවන්
   2. ණයගැතියන්
   3. අධ්‍යක්‍ෂවරු
   4. කොටස්කරුවන්

19. සමාගමේ ලාභයෙන් කොටසක් ලබා ගන්නේ,
   1. ලාභ ලෙස ය.
   2. වැටුප් ලෙස ය.
   3. පොළි ලෙස ය.
   4. ලාභාංශ ලෙස ය.

20. ව්‍යාපාර කටයුතු වලට බලපෑම් අති කරන ජීවන වියදම, සේවා නියුක්ති මට්ටම, ජාතික ආදායම, උද්ධමනය ආදි සාධක ක්‍රියාත්මක වන ව්‍යාපාරික පරිසරය වන්නේ,
   1. සමාජ හා සංස්කෘතික පරිසරයයි.
   2. තාක්‍ෂණික පරිසරය යි.
   3. නෛතික පරිසරය ය.
   4. ආර්ථික පරිසරය යි.

21. ව්‍යාපාර ආයතනයක් තම අනාගත සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දී සැලකිලිමත් වන කරුණක් වන්නේ (W5 අනුකූලව)
   1. අයවැය වාර්තා සකස් කිරීම
   2 සුදුසු ස්ථානයක් තිරණය කිරීම
   3. ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවයන් පිළිබඳ සැලකිල්ලට ගැනීම.
   4. කොතරම් කාලයකින් අරමුණු ලගා කර ගන්නේ ද?

22. අළෙවි සැලැස්මක් පිළියල කිරීම ව්‍යාපාර සාර්ථකත්වයට ප්‍රබල හේතුවක් වනු ඇත. අළෙවි සැලැස්මක අඩංගු නොවිය යුතු කරුණක් වන්නේ,
   1. මාස ගණන (සැලැස්ම ක්‍රියාත්මක) වර්ෂ හෝ විය හැක.
   2. භාණ්ඩ හෝ සේවා පිළිබඳ විස්තර
   3. ඇස්තමේන්තු ගත වියදම හා ලාභය
   4. ඉහත සියල්ලම.

23. උපකාරක සේවාවක් ලෙස සැලකිය නොහැක්කේ,
   1. සිල්ලර වෙළෙඳාම   2. සන්නිවේදනය   3. බැංකු   4. ප්‍රවාහනය


24. එකතු කළ අගය වන බදු (VAT) අය කරනු ලබන්නේ,
   1. රේගු දෙපාර්තමේන්තුව   2. දේශිය ආදායම් දෙපොර්තමේන්තුව
   3. පලාත් සභාව   4. ස්වදේශ කටයුතු දොපර්තමේන්තුව


25. මූලික පිරිවැය කාණ්ඩය වන්නේ,
   1. ද්‍රව්‍ය පිරිවැය, ශ්‍රම පිරිවැය, වෙනත් පිරිවැය   2. කම්හල් පොදුකාර්ය පිරිවැය, කම්හල් පිරිවැය
   3. නිෂ්පාදන පිරිවැය, මුලු නිෂ්පාදන පිරිවැය   4. සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය, සෘජු වෙනත්.


26. නිෂ්පාදන පිරිවැය සම්පූර්ණ වන්නේ,
   1. අමුද්‍රව්‍ය හා සෘජු වියදම් වල එකතුවෙනි.   2. ආරම්භක අමුද්‍රව්‍ය හා ගැණුම් අමුද්‍රව්‍ය එකතුවෙනි.
   3. කම්හලේ සම්පූර්ණ වියදම් වල එකතුවෙනි.   4. ප්‍රාථමික පිරිවැය හා පොදු කාර්ය පිරිවැය එකතුවෙනි.


27. සාමාන්‍ය චෙක්පතක් වලංගු කාලය
   1. මාස 2   2. දින 30   3. දින 15.   4. මාස 6

28. චෙක්පතක චුම්බක තින්ත අක්ෂර හැඳුනුම් තිරුවේ (*MICR*) ප්‍රථමයෙන් සඳහන් වී ඇති අංක කාණ්ඩයෙන් දැන ගත හැකි වන්නේ,
   1. චෙක්පත් අංකය   2. ජංගම ගිණුම් අංකය   3. බැංකු ශාඛාවේ අංකය   4. බැංකුවේ අංකය

29. විශේෂ රේඛණය මින් කුමක් ද?
   1. 

   2. 

   3. 

   4. 


30. ඉක්මනින් ප්‍රතිචාර දැක්විය හැකි සන්නිවේදන ක්‍රමය වන්නේ,
   1. රැස්වීම්   2. ඊ-මේල්   3. දැන්වීම් පුවරු   4. අන්තර් ජාලය

31. පෞද්ගලික අංශයේ ව්‍යාපාරයක් නොවන්නේ,
   1. රාජ්‍ය සංස්ථා   2. හවුල් ව්‍යාපාර   3. සමුපකාර සමිති   4. සීමිත සමාගම්

32. විකුණුම් මිල තිරණය කිරීමේ දී සැලකිල්ල ට ගත යුතු සාධකයක් වන්නේ,
   1. පිරිවැය   2. ඉල්ලුම   3. තරගකාරිත්වය   4. ඉහත සියල්ල ම.

හතරවන පිටුව බලන්න

33. අලෙවි සැලැස්මක් සකස් කිරීමේ දී එහි අන්තර් ගත කළ යුතු කරුණක් නොවන්නේ,
   1. විකුණුම් / ආදායම 2. ඒකකයක මිල 3. අතිරික්තය / ලාභය 4. විකුණන කාලය

34. තමාගේ නිෂ්පාදිතය සැලසුමකට අනුව නිෂ්පාදනය කිරීමටත්, අදාළ සියලු වියදම් ඇතුලත් කරමින් ව්‍යාපාරිකයෙක් සකස් කරනු ලබන්නේ,
   1. ව්‍යාපාර සැලැස්ම
   2. අලෙවි සැලැස්ම
   3. මෙහෙයුම් සැලැස්ම
   4. කළමණාකරණ සැලැස්ම

35. ව්‍යාපාර අවස්ථාවක් තුළින් ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී මුදල් ආයෝජනය කල යුතුය. එම ආයෝජන මුදල තමන් විසින් ම හෝ බාහිරින් සපයා ගත යුතුය. එසේ බාහිරින් මුදල් සපයා ගැනීමේ මාර්ගය වන්නේ,
   1. බැංකු ණය 2. ආධාර 3. ආයතනික ණය 4. මේ සියල්ල ම.

36. ගොවිතැනෙන් ජීවත් වන පියදාස තම නිෂ්පාදන ඉරිදා පොළට ගෙන ගොස් විකුනා ඔහුට අවශ්‍ය අනෙකුත් ද්‍රව්‍ය මිලදී ගනී. මෙම සිද්ධිය තුළින් මතුවන නිෂ්පාදන සංකල්පය කුමක් ද?
   1. ඍජු නිෂ්පාදනය
   2. වක්‍ර නිෂ්පාදනය
   3. සේවා නිෂ්පාදනය
   4. ප්‍රාථමික නිෂ්පාදනය.

37. අද පවතින නූතන ආර්ථික ක්‍රමයට පදනම වැටුණේ,
   1. භාණ්ඩ හුවමාරුව ය.
   2. මුදල් භාවිතය නිසා ය.
   3. ඉලෙක්ට්‍රොනික වාණිජ්‍ය නිසා ය.
   4. ඉලෙක්ට්‍රොනික මුදල් භාවිතය නිසා ය.

38. ලෝකයේ දේශ සීමා බිඳ වැටී එකට වෙළෙඳ පොලක් බවට පත් වීම හඳුන්වන්නේ,
   1. විශ්ව ගම්මානය
   2. ගෝලීයකරණය
   3. ලෝක වෙළෙඳ පොල
   4. ඉහත සියල්ලම

39. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර සාධක ලෙස සැලකෙන්නේ,
   1. කලමණාකරුවන්, අයිතිකරුවන්, සේවකයන් හා ගනුදෙනුකරුවන්.
   2. හිමිකාරිත්වය, ගොඩනැගිලි, අභ්‍යන්තර පිරියත, ඉන්ටර්කොම් පද්ධතිය.
   3. අභ්‍යන්තර වායු සමනය, භූමි අලංකරණය, සන්නිවේදන පද්ධතිය.
   4. තාක්ෂණික විද්‍යුත්මක හා පරිගණක පද්ධති ජාලයකට සම්බන්ධ වී තිබීම.

40. චමින්ද පෙරේරා හෝ රැගෙන එන්නාට රු. දස දහස් පන්සියක් පමණක් ගෙවනු යනුවෙන් චෙක්පතක සඳහන් වුවහොත් එය කුමන වර්ගයේ චෙක්පතක් ද?
   1. විධාන චෙක්පතකි.
   2. ධාරක චෙක්පතකි.
   3. රේඛිත චෙක්පතකි.
   4. විකල චෙක්පතකි.

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක

සිසිර කුමාර විසින් සම්පාදිත යි.